මෙල්බන් නුවර ''කලා පුරයක්'' බවට පත්ව ඇතැයි අපි නිතර සිහිපත් කරන්නෙමු. තමන් රිසි දේ තෝරා බේරාගෙන රස විඳීමට හැකි වන තරම් ප්‍රමාණයක් මේ වන විට මෙල්බන් නුවර සෑම සති අන්තයකම සංවිධානය වෙයි. තරමක් දුරට අඩුවන්නේ නත්තල් නිවාඩු කාලයේදීයි.

මෙල්බන් නුවර තත්වය එසේ වුව ද ඕස්ට්‍රේලියාවේ අනෙකුත් නගර වල තත්වය මෙය ම නොවේ. මව්බිමෙන් මෙහි පැමිණෙන කලා කරුවන් සම්බන්ධ වන කලා උත්සව වෙනත් නගරවල සංවිධානය වන්නේ සාපේක්ෂව අඩු ප්‍රමාණයකිනි. මෙල්බන් නුවර පවා අපගේ නිර්මාණ ඉදිරිපත් කිරීමේ ප්‍රවණතාවය අඩු වෙමින් යද්දී සාපේකෂව අඩු කලා

ඉන්නවා. ඒ අතරේ වයස අවුරුදු 8 - 17 අතරේ දරුවන් අටදෙනෙකුත් ඉන්නවා. ධම්මික අධිකාරි, ප්‍රසාද් වඩුගේ, තරින්ද ගුණවර්ධන, ඩිලේකා ලියනගේ, රයනි සුබවීරගේ, රේචෙල් රාජපක්ෂ, තනුර අබේරත්න, අයෝමාලි කරුණාදාස, ජයමාලි කරුණාදාස, සෙනදි වඩුගේ, රඟපෑම් වලිනුත්, පසන්දි වඩුගේ, රිචනා රාජපක්ෂ, සනායා ආරච්චිගේ, විනාරි සිල්වා, සනුකි ජයශේකර, මෙතුමිණි ඇලැහැබඩගෙදර, දිනුරි ගමගේ, අයන්සා ගමගේ, අෂ්ලේෂා ජයතිලක, දුන්යාෂා රත්නායක, පියුෂි බණ්ඩාර, තරින්යා හෙන්නැදිගේ, සනාරා හෙන්නැදිගේ නර්තනයෙනුත් අපිත් එක්ක සම්බන්ධ වෙනවා.

# කැන්බරාහි ඉඳුනිල් ලියනගේගෙන් "කලබල නගරය"

උළෙලවල් සංවිධානය වන කැන්බරා වැනි නුවරක අපේ ම නිර්මාණයන් වේදිකාගත කරමින් උඩු ගං බලා පිහිනන පිරිසකගේ උත්සාහයක් පිළිබඳවයි මේ සටහන. මේ පිළිබඳව කැන්බරා නුවර සිටි අපව දැනුවත් කරන්නේ කලක් අප හා මෙල්බන් හි විසූ ඉඳුනිල් ලියනගේ මහත්මියයි.

''මම දෙවෙනි වතාවට නිර්මාණය කරපු ''කලබල නගරය'' වේදිකා නාට්‍ය භූමිකා පහකින් සමන්විතයි''. ඉඳුනිල් කතා බහට මුල පිරුවාය. ''නාට්‍යය පටන්ගන්නේ ගීයකින් නාට්‍ය ධර්මී ලෝක ධර්මී දෙවිදියෙන්ම ඉදිරිපත් වෙන මේ නිර්මාණය ඇත්තට ම ගීතමය නාට්‍යයක්. ජානක බානගල මහත්මයා නිර්මාණය කරපු ගීත දොළහක් ඇතුලත් ''කලබල නගරය'' නාට්‍යයේ නර්තන වින්‍යාසය භාග්‍යා පලිහවඩන මහත්මියගෙන්. නාට්‍යයේ කණ්ඩායම 27 දෙනෙක්

''හාමෝනියම්'' එක වාදනය කරමින් සංගීතය මෙහෙයවන්නෙ ජානක බානගල මහත්මයා. තබ්ලාවෙන් ධර්ම ශ්‍රී පතිරත්න, රිදම් ගිටාරයෙන් සංජය ගුණවර්ධන සහ රසික පෙරේරා, යක් බෙරයෙන් කලිඳු වීරසිංහ, සර පුවරුවෙන් චතුර බයන්දුතුංග, වයලීනයෙන් රවි කුලතිලක සහ හිරාන් කුලතිලක සහ බේස් ගිටාරයෙන් අග්‍රා ප්‍රෙමරත්න කියන මහත්වරු සංගීතය වයන්න දායක වෙනවා.''

''අපේ නාට්‍යය ඔක්තෝබර් 22 දා පස්වරු 2.00 ටත් හවස 6.30 ටත් දෙවාරයක් කැන්බරා නගරයේ ''ඒ.එන්.යූ. ආර්ට්ස් සෙන්ටර්'' හිදී වේදිකා ගත වෙනවා. එදාට ශ්‍රී ලංකා මහ කොමසාරිස් සෙ'මසුන්දරම් ස්කන්ධකුමාර් මහත්මයාත් මෙහි සිටින තවත් කලා කරුවන් පිරිසකුත් සහභාගි වෙනවා.''

''මේ කැන්බරා නුවර නිර්මාණය වෙලා වේදිකාගත වෙන දෙවෙනි සිංහල නාට්‍යයයි. මෙල්බන් නුවරින් කැන්බරා නුවරට කසංක්‍රමණය වුණු ඉඳුනිල් ලියනගේ මහත්මියට මේ උනන්දුව ඇතිවූයේ මෙල්බන් නුවරදී යැයි කිවහොත් නිවැරදියි. වසර 1996 දී මෙල්බන් නිෂ්පාදනයක් ලෙස මහචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ ''මනමේ'' නාට්‍යයේ උද්‍ධෘතයක් වේදිකාගත වූ අවස්ථාවේ එහි මනමේ කුමරිය ලෙස රඟපෑවේ ඇයයි. ජය ශ්‍රී චන්ද්‍රජිත් රංගධරයාණන්ට අනුව ''මහාසාර'' නාට්‍යයේත් තරංග දන්දෙණිය අධ්‍යක්ෂකවරයාගේ ''ඇගමෙම්නන්'' නාට්‍යයේත් රඟපෑ ඉඳුනිල් ''ස්කැට්ස්'' සංවිධානයේ නාට්‍යය උත්සවයේදී ''මරණය'' නාට්‍යය වෙනුවෙන් කළ රඟපෑම වෙනුවෙන් හොඳම නිළිය සඳහා වූ සම්මානයෙන් පිදුම් ලැබුවාය. ගායනයෙන් හා රංගනයෙන් කැන්බරාහි දී ''සැඳෑ ප්‍රතිභා සරණිය'' සඳහා වසර 2008 දී ඇය දායක වූයේ කලා ශූරී ආචාර්ය ෂෙල්ටන් ප්‍රේමරත්න සංගීතවේදියාණන්ට උපහාර වශයෙනි. මෙල්බන් හි ''ස්කැට්'' සංවිධානයෙන් සංවිධානය කළ කෙටි නාට්‍ය උළෙල වෙනුවෙන් ඉඳුනිල් කැන්බරා හි සිට නිර්මාණය කළ ''කපුටා සහ කේජු'' රැගෙන මෙල්බන් නුවරට පැමිණියාය. 2012 දී නිෂ්පාදනය වූ ''සැබෑ විනිශ්චය'' ඇයගේ මුල් ම අධ්‍යක්ෂණයයි. එය හොව්කර් විද්‍යාලයේ ''මරන්පි තියටර්'' හිදී සාර්ථකව වේදිකාගත වූ අතර එය කැන්බරා නුවර වේදිකාගත වූ ප්‍රථම සිංහල නාට්‍යයයි.

''මගේ සම්පූර්ණ උත්සාහය වන්නේ අපගේ සිංහල නාට්‍යයේ උන්නතිය සහ මතු පරපුරට මේ අගනා කලාව දායාද කිරීමයි" ඉඳුනිල් ලියනගේ මහත්මිය කතිකාව නිමා කරමින් අප හා පැවසුවාය.







# කහපාට මුහුදු වෙරළට සිංහයන් පැමිණ සිටියේ නැත

## උපේක්ෂා නුවන්ශ්‍රීනි



ප්‍රවීන පරිවර්තකයකු වූ සිරිල් සී පෙරේරා මහතා අභාවප්‍රාප්ත විය.

යුද්ධය හා සාමය කර්මසෝ සහෝදරයෝ මහල්ලා සහ මුහුද එමා බෝවාරී වෘකයන් අතර නග්නව ඇතුළු කෘති ගණනාවක් පරිවර්තනය කළ ඔහු ධර්මසිරි බණ්ඩාරනායක විසින් නිර්මාණය කළ මකරාක්ෂයෝ, ධවල භීෂණ ආදී පරිවර්තන වේදිකා නාට්‍යවල පරිවර්තකයා ලෙස කටයුතු කළේය.

ඔහුගේ පරිවර්තන කෘති අතරින් මා වඩාත් ප්‍රිය කළේ බෲනෝ ආර්පිට්ස්ගේ වෘකයන් අතර නග්නව කෘතියයි. පරිවර්තකයාගේ දක්ෂතාව යනු ලේඛකයාව සහමුලින් අමතක වීමය. යළිත් මුල්පිටපත් සොයා බලන්නට නොසිතෙන තරමට ඔහු ලේඛකයාට සහ කෘතියේ විශිෂ්ටත්වයට සාධාරණත්වයක් ඉටු කළේය. නමුත් දළ කපාගෙන කෞතුකාගාරයට වඩම්මා ඒ දළ අත ගා වර්ණනා කරද්දී , ඇතා වනයේ හුදකලාවී පණ අදින්නාක් මෙන් සත්‍ය වශයෙන්ම දක්ෂතා ඇති මහා වෘක්ෂ බඳුව පොලවට මුල් අදින ලද මිනිසුන්ට නිසි වටිනාකමක් ලැබුනේ නැත. ඒ වෙනුවට විධායක තනතුරු දරමින් නගරයට කේන්ද්‍රිතව කුමක් හෝ කුරුටු ගාමින් සෙනසුරාදා හතට විතර පොලේදී ලැබෙන ලාබ බීට් රූට් වැනි චරිත ඉස්මතු විය.

හෙමිංවේගේ මහල්ලා සහ මුහුද කෙටි කතාව (කෙටි නවකතාව) මම කිහිපවාරයක්ම කියවීමි. සම්තිගුල් මහල්ලා මෝරා සමග සිය පුංචි බෝට්ටුවේ සංග්‍රාම කරන විට මම ද ඒ සංග්‍රාමයට මනසින් හවුල් වීමි. ඒ දුප්පත් ධීවරයාගේ ප්‍රකෘතිය ඔහුගෙන් මග හැරී ඔහු සිතින් පෝසත් සිහින දකිද්දි මමද ඒ ලෝකයට ආදරය කළෙමි. නමුත් අවසානයේ මෝර්ද සම්තිගුල් ද යන දෙදෙනාම අතිශය හෙම්බත් වේ. වෙරළට ගසාගෙන විත් දපා හිදින සම්තිගුල් මහල්ලාව දෝතට වඩාගෙන යන්නේ ගෙදර සිටින කොලුවාය. එදා රෑ මහල්ලා සිහිනයක් දකියි. ඒ තනි වාක්‍යය මට තවම මතකය

"කහපාට මුහුදු වෙරළට සිංහයන් පැමිණ සිටියේය"

කෙටිකතාව අවසන් වන්නේ තැනිනි. එහි අරුත සමෘද්ධිමත් අවස්ථාවල මිනිසා සිංහ සෙය්යාවක් ගන්නා බවද? මම ඒ සිහිනය පෙරළ පෙරලා ජීවිතයේ කුඩා සිද්ධි සමග ගලපමින් එකල්හි මාවම සෙවීමි.

වල්වැදුණු ගුරුපාරක් දෝතින්ම සමතලා කොට මහා ප්‍රභාවකින් සරු සාහිත්‍යය කරපිට තියාගෙන වැඩි ඇත් රජුනි ! ඒ සම්තිගුල් නම් මහල්ලා බිහිසුණු මෝරා සමග සටන් කරමින් තණ්හාව සහ පුද්ගල අභ්‍යන්තර චිත්ත ස්වභාවය සමග දඟ දමන තුරුම එකල මම ද ඔබ සමග කහපාට මුහුදු වෙරළට සිංහයන් එනතුරු බලා සිටියෙමි. නමුත් උන් කෙදිනකවත් මුහුදු වෙරළට පැමිණියේ නැත.

ආදරණිය මිනිසාණෙනි ! ඔබට නිවන් සුව ලැබේවා..!

## අධිවේගී පාරකදී අමතක කළ දළ ඇතෙකුට හෙවත් සිරිල් සී පෙරේරාට,

දළ කපා ගත් පසුව මහවනේ අතහැරිය
රජ ඇතෙක් වගෙයි නුඹ පෙරහැරෙන් මගහැරුණ
පරපුරක් එකතු වී තනාගත් මාවතක
පෙරහැරක් ගිය බවට ලකුණකුදු ඉතිරි නැත
රැදුරු ගල් උගුලුවා නැවුම්පස් අතුරුවා
පයින් පාගා සිනිඳු ලෙස තැනූ ගුරුපාර
ට්‍රැක්ටරෙන් හුස්ම පිඹ එලා කළුගල් පලස
පයෙහි විසකටු ඇනෙන උගුලක්ය මේ අලුත් මහපාර
දල්වා බුබුළු විදුලිය හිස මත නටන
කැන්දාගෙන කරඩු වැඩියා මට මතක
බීප් බීප් සද්දය දාගෙන දුවන
පෙට්රබල් සතුන් ලග ඇත්රජ ඉකිබිදින
මහ ධුම් ඇද වැටෙයි පොළවට වරින් වර
විස දුම් හතිදමයි අහසට පෙමින් මෙන
වාවාගන්න බැරි ඉස්සර මතකයක
කරඬුව තරම් ඇත්රජ දිලිසුණෝ කිම.